# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2054/11 – 2018 ජනවාරි මස 15 වැනි සඳුදා – 2018.01.15**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/09/01/2007

**කාර්මික ආරවුල් පනත 131 වන අධිකාරය**

අංක 2015/49 දරන හා 2017.04.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් රාගම, වල්පොල, අංක 332 බී හි පදිංචි බී. විශාඛා රණතුංග මිය හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කම්කරු මහලේකම් කාර්යාලය, 1 වන මහල හි පිහිටි සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3616 දරන හා 2017.01.27 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් බී. විශාඛා රණතුංග මිය වෙතින් කාර්මික ආරවුල් පනතේ 20 (1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3616 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2018.04.20 දින සිට අවසන් වන බවට පනතේ 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 26940 – 19 (2018/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය
'' අ'' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත**

**බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම.**

ලිපිනය: බී. විශාඛා රණතුංග
නො. 167, ''වාසනා'',
වීරරත්න මාවත, වල්පොල,
රාගම.
දිනය: 2017.10.27

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට ය.

2017.04.20 දිනැති අංක 2015/49 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද බී. විශාඛා රණතුංග සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය බැඳී සිටින්නා වූ ද 2017.01.27 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02 - 28

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.